අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"இசுருபாய", பத்தரமுல்லை, இலங்கை.
"Isurupaya", Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk


මගේ අංකය / எனது இல. / My Ref: ED/05/67//4/අභ.ස්මා/කසේනි/2021
ඔබේ අංකය / உமது இல. / Your Ref:
දිනය / திகதி / Date: 2021.03.17

අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම අංශ භාර මාණ්ඩලික නිලධාරීන්,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
සියලුම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,
සියලුම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්,
සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන්,

**අභ්‍යන්තර ස්ථාන මාරුවීම (ඒකාබද්ධ සේවය) – 2021**
**සංවර්ධන නිලධාරී සේවය, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය, කළමනාකරණ සේවා නිලධාරී සේවය, කාර්යාල සේවක සේවය හා රියදුරු සේවය**

රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන ,අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකර ඇති ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COMS/Trans/V/වා/.මා.ස.2021 හා 2020.08.31 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2020 හා බැඳේ.

02. 2021 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ සේවා ස්ථාන වන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව/ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ/ ගුරු විද්‍යාල හා ජාතික පාසල් අතර අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන සංවර්ධන නිලධාරී සේවයේ, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ, කළමනාකරණ සේවා නිලධාරී සේවයේ, කාර්යාල සේවක සේවයේ හා රියදුරු සේවයේ නිලධාරීන් මේ සමග අමුණා ඇති **අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම් පත්‍රය සම්පූර්ණ කර 2021.04.05 දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඒකාබද්ධ සේවා) වෙත ඉදිරිපත් කළ යුතු අතර 2021 වර්ෂය සඳහා වාර්ෂික ස්ථාන මාරු ලබා ඇති නිලධාරීන් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අයදුම් නොකළ යුතුය .**

03. අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය ඇමුණුම 01 මගින් දැක්වේ.

සුභාෂිණී තුලතුංග මුදලි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඒකාබද්ධ සේවා)
අධ්‍යාපන ලේකම් වෙනුවට

ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන් සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය

අධ්‍යාපන අමාත්‍යාංශය

1. හැඳින්වීම

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COM/Trans/V/වාස්මා/2021 හා 2020.08.31 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2020 අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවයේ නිලධරයන් සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය සකස් කරනු ලැබේ.

2. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර

2.1 අදාල නිලධරයන්

ඒකාබද්ධ සේවයට අයත් පහත සඳහන් සේවාවන්හි නිලධරයන් සඳහා මෙම වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය අදාල වේ.

I. සංවර්ධන නිලධාරි සේවය (III / II/ I ශ්‍රේණි)
II. ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය (III / II/ I ශ්‍රේණි)
III. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය (2/3 පන්ති)
IV. කළමනාකරණ සේවා නිලධාරි සේවය (III / II/ I ශ්‍රේණි)
V. කාර්යාල සේවක සේවය (III / II/ I ශ්‍රේණි)
VI. රියදුරු සේවය (III / II/ I ශ්‍රේණි)

2.2. සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය

2.2.1. අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසරක් (වසර 01 ක්) සේවය කරන ලද නිලධරයන් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.2.2. අධ්‍යාපන අමාත්‍යාංශය හෝ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ජාතික පාසල්, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු විද්‍යාල යන සේවා ස්ථාන වලින් එකම සේවා ස්ථානයක වසර 05 කට වැඩි කාලයක් සේවය කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

2.3. අභ්‍යන්තර ස්ථාන මාරු වලට අයත් වන සේවා ස්ථාන

I. අධ්‍යාපන අමාත්‍යාංශය
II. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
III. ජාතික පාසල්
IV. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
V. ගුරු විද්‍යාල

## 2.4. ක්‍රමවේදය හා අනෙකුත් කරුණු

I. 2021 වර්ෂය සඳහා වාර්ෂික ස්ථාන මාරු ලබා ඇති නිලධරයන් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අපදූම් <u>නොකළ යුතුය.</u>

II. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි 2.2.1 ඡේදය යටතට ගැනෙන නිලධරයෙකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටෙක එම ඉල්ලීම ඉටුකිරීම සඳහා 2.2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එක් සේවා ස්ථානයක හෝ සේවා ස්ථාන සමූහයක් තුළ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කළ හැක.

III. යම් සේවා ස්ථානයකට ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට ඒ අතරින් වැඩි සේවා කාලයක් හෝ ඉහත 2.2.2. හි අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධරයෙකු (අනෙකුත් කොන්දේසි වලට යටත්ව) එම සේවා ස්ථානයට මාරු කරනු ලැබේ.

IV. ස්ථාන මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේදී සේවා අවශ්‍යතාවයන්ද කාර්යාලවල කාර්ය මණ්ඩල කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමට ද හැම විටම උත්සාහ කළ යුතුය.

V. ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක නොවන්නේ නම්, අධ්‍යාපන ලේකම් විසින් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග අනුව කටයුතු නොකරන නිලධාරීන්ගෙන් එසේ කටයුතු නොකිරීමට හේතු විමසනු ලැබේ.

VI. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුව වෙත සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මත ස්ථාන මාරුවීම් ලබාදීමේ ගැටළු පැන නැගී ඇත්නම් සමාලෝචන කමිටුව මඟින් එම කරුණු සලකා බලා නව ස්ථාන මාරු ලබා දීමේ හැකියාව ඇති අතර එවැනි නිලධාරීන් විසින් සිදු කරන අභියාචනා නැවත සලකා බලනු නොලැබේ.

### 2.4.1. සේවා කාලය ගණනය කිරීම

I. අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ජාතික පාසල්, විද්‍යාපීය සහ ගුරු විද්‍යාල අතර අභ්‍යන්තර ස්ථාන මාරුවීම් උපරිමය වසර 10 ක් දක්වා ( ස්ථාන මාරු අවස්ථා 02 ක් යටතේ) පමණක් සිදු කරනු ලැබේ.

II. එක් ජාතික පාසලක වසර 05 ක් සේවය කර ඇති නිලධාරියෙකු නැවත ජාතික පාසලකට ඉල්ලුම් කිරීමේදී අනෙකුත් නිලධාරීන් හට අවස්ථාව ලබා දීමෙන් පසුව සලකා බලනු ලැබේ.

## 3. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

I. ඒකාබද්ධ සේවා අංශයේ සහකාර ලේකම්

II. වෙනත් අංශයක සහකාර ලේකම්වරයෙකු

III. ඒකාබද්ධ සේවා අංශයේ පරිපාලන නිලධාරී

IV. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවේ විෂය පරයට අයත් වන නිලධර කණ්ඩායම් වලට හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගේ නියෝජනයක් සහිත වෘත්තීය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙන් හෝ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධාරියෙක්

4. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

I. ඒකාබද්ධ සේවා අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
II. වෙනත් අංශයක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් දෙදෙනෙකු
III. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවේ විෂය පථයට අයත් වන නිලධර කණ්ඩායම් වලට හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගේ නියෝජනයක් සහිත වෘත්තීය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධාරියෙක්

5. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

6.1. විශේෂිත කරුණු

I. වයස අවුරුදු 58 සම්පූර්ණ වූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි ස්ථාන මාරු කරනු නොලැබේ.
II. ඒකාබද්ධ රියදුරු සේවයේ නියුතු නිල රථ රියදුරන් සම්බන්ධ තොරතුරු වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුව රැස්වීමට පෙර දැන්විය යු තුය.
III. අභ්‍යන්තර ස්ථාන මාරුවීම් එක් එක් සේවාවන් සඳහා වෙන් වෙන් වශයෙන් සලකා බලනු ලැබේ.
IV. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්ෂික ස්ථාන මාරු තීරණ සමඟ සම්බන්ධ කරනු ලබන අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා ක්‍රියාත්මක දිනය වන්නේ 2021.06.01 දිනය.

6. ඒකාබද්ධ සේවා අංශයේ අභ්‍යන්තර ස්ථාන මාරු කාල සටහන

| | |
|---|---|
| 2021.03.22 | අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම |
| 2021.04.05 | අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනය |
| 2021.04.09 | අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය රැස්වීම |
| 2021.04.19 | අභ්‍යන්තර ස්ථාන මාරු තීරණ දැනුම් දීම/අභියාචනා කැඳවීම |
| 2021.05.03 | අභියාචනා භාරගන්නා අවසාන දිනය |
| 2021.05.06 | අභියාචනා මණ්ඩලය රැස්වීම |
| 2021.05.13 | අභියාචනා තීරණ දැනුම් දීම |
| 2021.05.17 | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ස්ථාන මාරු තීරණ දැනුම් දීම |
| 2021.06.01 | වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු දිනය |

සුභාෂිණී තුලතුංග මුදලි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඒකාබද්ධ සේවා)
අධ්‍යාපන ලේකම් වෙනුවට

2021.03.17 දින.

**අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින සේවා ස්ථාන අතර වාර්ෂික අභ්‍යන්තර**

**ස්ථාන මාරුවීම් අයදුම්පත්‍රය - 2021**

1. **නිලධාරියාගේ /නිලධාරිනියගේ**

   I. සම්පූර්ණ නම :- ..........................................................................................................

   ..........................................................................................................මයා /මිය මෙනවිය.

   II. තනතුර :- ..........................................................................

   III. පදිංචි ලිපිනය සහ ආසන්නතම නගරය :-

   ..........................................................................................................

   ..........................................................................................................

   IV. වර්තමාන සේවා ස්ථානයට පදිංචි ස්ථානයේ සිට දුර (කි.මී.) :-

   ..........................................................................

   V. උපන් දිනය :- වර්ෂය ..............දිනය.................. මාසය ..................

   VI. ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................................................

   VII. දුරකථන අංකය :-පෞද්ගලික ................................ රාජකාරී ..............................................

   VIII. විවාහක අවිවාහක බව :-..........................................................................

   IX. දරුවන් ගණන හා ඔවුන්ගේ වයස :- ..........................................................................

   X. පාසල් යන දරුවන් වෙතොත් ඔවුන් 2020 වර්ෂයේ ඉගෙනුම ලබන පාසල හා පන්තිය

      1. ..........................................................................................................
      2. ..........................................................................................................
      3. ..........................................................................................................

2. **නිලධාරියා /නිලධාරිණිය.**

   I. දැනට සේවය කරන ස්ථානය/ශාඛාව ..........................................................................

   II. අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවයට වාර්තා කල දිනය ..........................................................................

   III. අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් සේවා ස්ථානවල සේවය කර ඇති කාල පිමාවන්:-

| අනු අංකය | සේවා කාලය | | සේවා ස්ථානය |
|---|---|---|---|
| | සිට | දක්වා | |
| | | | |
| | | | |
| | | | |

3. **අභ්‍යන්තර ස්ථාන මාරු ඉල්ලුම්කරන සේවා ස්ථාන.**

| අනු අංකය | සේවා ස්ථානය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

4. **අභ්‍යන්තර ස්ථාන මරු ඉල්ලීමට හේතු** :-

..........................................................................................................

..........................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍යය බව ප්‍රකාශ කරන අතර එම තොරතුරු අසත්‍ය බව සනාථ වුවහොත් විනයානුකූලව කටයුතු කල හැකි බව මම දනිමි.

දිනය .............................. අත්සන

5. **ආයතන ප්‍රධානියාගේ /ආසන්න මාණ්ඩලික නිලධාරියාගේ නිර්දේශය** :-.

සුදුසු අනුප්‍රාප්තිකයෙක් සහිතව/රහිතව/නිලධාරියා/නිලධාරිණිය මුදාහැරිය හැකි/නොහැකි බැවින් අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

දිනය ...................................................... අත්සන සහ නිල මුද්‍රාව